**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර – නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - දෙසැම්බර් – 2022

இளங்கலைமாணிப் பட்ட பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் - டிசம்பர் 2022

**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level – December - 2022**

## MICROECONOMIC THEORY (ECNE 201)

කාලය පැය (03) තුනයි.
**(மூன்று) 03) மணித்தியாலங்கள்**
Time three **(03)** Hours.

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
**வினாக்களுக்கு மட்டும் விடையளிக்க.**
Answer **five** (05) questions only.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
**எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.**
Marks will be deducted for illegible hand writing.

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සංඛ්‍යාව හතකි (07)
**இந்த வினாப்பத்திரத்தில்**– (07) **–வினாக்கள் உள்ளன.**
There are **seven (07)** questions in the question paper.

---

1. i. උපේක්ෂා වක්‍රයකින් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

   ii. සාමාන්‍ය භාණ්ඩ දෙකක් සඳහා වන උපේක්ෂා වක්‍රයක් පහළට බෑවුම් වන්නේ සහ මූලයට උත්තල වන්නේ ඇයි? (ලකුණු 06)

   iii. අයවැය සංරෝධක සංකල්පය රූප සටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

   iv. පාරිභෝගික සමතුලිතතාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ක්‍රම සූචක උපයෝගිතා ප්‍රවේශය යටතේ පාරිභෝගික සමතුලිතතාවය සඳහා වන කොන්දේසි මොනවාද? (ලකුණු 06)

2. i. කෙටිකාලීන සහ දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස කුමක්ද? (ලකුණු 04)

   ii. කෙටිකාලයේදී ආයතනයක නිෂ්පාදනයේ විවිධ අධියරයන් ප්‍රස්ථාරිකව දක්වන්න. එම එක් එක් අධියරයන්ගේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

   iii. නිෂ්පාදනය එක් විචල්‍ය යෙදවුමක් සමඟ සිදුවන විට විචල්‍ය සමානුපාත ඵල නියමය පැහැදිලි කරන්න. (ලකුණු 05)

   iv. සම නිෂ්පාදන වක්‍රවල ගුණාංග/ලක්ෂණ මොනවාද? සුදුසු රූප සටහනකින් ඔබගේ පිළිතුර දක්වන්න. (ලකුණු 05)

3. i. සම්ප්‍රදායික සහ නූතන පිරිවැය න්‍යාය අතර මූලික වෙනස කුමක්ද? (ලකුණු 04)

   ii. නූතන පිරිවැය න්‍යාය යටතේ ආයතන ව්‍යුහමය සංචිත ධාරිතා සහිත යන්ත්‍ර හා සම්බන්ධ වන්නේ ඇයි? (ලකුණු 05)

   iii. ආයතනයක පිරිවැය ශ්‍රිතය පහත දැක්වෙන ලෙස දී ඇතැයි සිතන්න

   $$TC = 6 + 3Q - 0.6Q^2 + 0.02Q^3$$

   a. එම ආයතනයෙහි සාමාන්‍ය පිරිවැය (AC ) ශ්‍රිතය සොයන්න (ලකුණු 03)

   b. ආන්තික පිරිවැය (MC) ශ්‍රිතය සොයන්න (ලකුණු 04)

   c. එම ආයතනය නිමැවුම ඒකක 100 ක් නිෂ්පාදනය කරන්නේ නම් සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ සාමාන්‍ය පිරිවැය (AC) කුමක්ද? (ලකුණු 04)

4. i. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක මූලික උපකල්පන මොනවාද? (ලකුණු 05)

   ii. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ආයතනයක් මිල ගනුවෙකු ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 05)

   iii. පූර්ණ තරඟකාරය යටතේ ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරන්නේ කෙසේද? (ලකුණු 05)

   iv. "පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක සියළු ආයතන කෙටිකාලයේදී ආර්ථික ලාභ උපයයි." මෙම ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න (ලකුණු 05)

5. i. ඒකාධිකාරී බලය සඳහා මෙහෙයවන සාධක මොනවාද? (ලකුණු 03)

ii. ඒකාධිකාරී ආයතනයක ධාරිතා උපයෝජනය පූර්ණ තරඟකාරී ආයතනයක එම තත්වය සමඟ සැසඳීමක් කරන්න. (ලකුණු 05)

iii. "කෙටිකාලයේදී ඒකාධිකාරී ආයතනයක් සාමාන්‍ය හෝ නිෂ්ප්‍රාමාණික ලාභ හෝ අලාභ ඇතිකරයි." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ඒකාධිකාරී ආයතනයක පහත දැක්වෙන ඉල්ලුම් සහ පිරිවැය ශ්‍රිත සලකන්න

$P=130-0.5Q$ $MC = 2Q+10$

එම ශ්‍රිත ආශ්‍රයෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

a. ලාභ උපරිමකරණ මිල සහ නිමැවුම් මට්ටම කුමක්ද? (ලකුණු 04)

b. ඒකාධිකාරී ආයතනයෙහි ලාභය සොයන්න (ලකුණු 04)

6. i. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. නිෂ්පාදන විවිධාංගිකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ඒකාධිකාරී තරඟ ආයතනයක මිල සහ නිමැවුම තීරණයවීමෙහිලා එය කුමන කාර්යභාරයක් ඉටුකරයිද? (ලකුණු 06)

iii. ආයතනයක විකුණුම් පිරිවැය සහ නිෂ්පාදනය පිරිවැය අතර වෙනස දක්වන්න (ලකුණු 04)

iv. ආයතනයක ප්‍රචාරණ වියදමෙහි උපරිම මට්ටම පැහැදිලි කරන්න. (ලකුණු 06)

7. පහත දැක්වෙන සංකල්ප අතර වෙනස්කම් දක්වන්න

i. ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය

ii. නිෂ්පාදනයේ ආන්තික අයභාරය (MRP) සහ ආන්තික නිෂ්පාදනයේ වටිනාකම (VMP)

iii. ආදායම් පරිභෝජන වක්‍රය (ICC) සහ මිල පරිභෝජන වක්‍රය (PCC)

iv. සම පිරිවැය රේඛාව සහ අය වැය රේඛාව

(ලකුණු 5 x 4)